# ගොවි පුබුදුව

(ඒ. මුතුබණ්ඩා කෘ. ව්‍යා. සේ. නැ/පලුගස්දමන)

පිකිරි මැණිකෙ කෑම අරන් කුඹුරට එනවා
නයිපෙන නටනා උකුලට ගිමන් ඇරෙනවා
ඒක දැකපු කොක්හාමිට ලැජ්ජ හිතෙනවා
ගොවිරාලත් මඩ සෝදු ගොඩට ඇදෙනවා

කුඹුර කොටා නියර බැඳල පෝරු තලනවා
පිකිරි මැණිකෙ පැල තවානෙ පැල උදුරනවා
ගමේ ළඳුන් ඔමරි පපා ගොයම් නෙලනවා
කොරවක්කෙක් ඒක දැකල හඬ තලවනවා

නෙළු ගොයම් ලියදිවලට ජලය ඇදෙනවා
වල් මැරෙන්න තෙල් බෙහෙතුත් හොඳට යොදනවා
පැල ගොයමට පෝර යොදල පඳුරු දමනවා
ගොවිරාලගෙ හිතේ සතුට මූවග'ට එනවා

දිනෙන් දිනම සරුව වැඞී කෙත පූදිනවා
කොරවක්කට මේක පෙනිල තරු විසි වෙනවා
කොක්සාමිත් වෙල උඩගින් විලට ඇදෙනවා
පිකිරි මැණිකෙ ළඳුන් සමග නෙළුමට එනවා

කැපූ ගොයම් මිටි බැඳ බැඳ කමතෙ හෙලනවා
අම්බරුවන් රැලක් ගෙනත් කොළ තලවනවා
ගැල් දෙක තුන වී පිරවී ගෙදර ඇදෙනවා
ගොවිරාලගෙ අටුකොටු පික ඉතිරී යනවා

සහල් වලින් නැව් පුරවා පිටරට ඇරියයි
රජ දවසෙත් හෙළ බිම රැක්කේ මේ ගොවියයි
කවදත් ජය සංකේතය වෙහෙර ලඟ වැවයි
රට ජාතිය බේර ගන්න ගොවියට බාරයි


5—ජේ 13297 (5/72)